සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල ( × ) ලකුණ යොදන්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 04 තෙක් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකා රජය රටේ ජනතාවට සෞඛ්‍යය සම්පන්න වස විසෙන් තොර නැවුම් එළවළු හා පලතුරු ලබා දීමේ අරමුණින් ගෙවතු වගා ගොවීන් දිරිමත් කිරීමේ වැඩ සටහන් දියත් කරමින් සිටී. ඒ වෙනුවෙන් ගොවීන්ගේ එළවළු හා පලතුරු මිලදී ගෙන අලෙවිකිරීමේ මධ්‍යස්ථානයක් ද පවත්වාගෙන යයි.

01. මෙම සිද්ධියට අදාළ අවශ්‍යතාවයක් වනුයේ,

(1) සෞඛ්‍යය (2) ආහාර (3) ආරක්ෂාව (4) ඖෂධ

02. ගොවීන්ගෙන් මිලදී ගත් නැවුම් එළවළු හා පලතුරු අලෙවි කිරීමේ ආයතන හඳුන්වනු ලබන්නේ,

(1) සේවා නිෂ්පාදන ව්‍යාපාර ලෙස ය. (2) තොග වෙළඳ ආයතන ලෙස ය.
(3) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර ආයතන ලෙස ය. (4) කෘෂිකාර්මික ආයතන ලෙස ය.

03. එළවළු හා පලතුරු වගා කිරීමට යොදා ගන්නා ඉඩම අයත් නිෂ්පාදන සාධකය වනුයේ,

(1) භූමිය ය. (2) ශ්‍රමය ය. (3) ප්‍රාග්ධනය ය. (4) ව්‍යවසාය ය.

04. මෙම සිද්ධියට අදාළව එළවළු හා පලතුරු නිෂ්පාදන ගොවීන්ගේ ගෙවතු වගා පිළිබඳ දැඩි උනන්දුවක් දක්වන පාර්ශවය වනුයේ,

(1) ගනුදෙනුකරුවෝ ය. (2) සැපයුම්කරුවෝ ය.
(3) ප්‍රජාව ය. (4) රජය ය.

05. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා සංකීර්ණවත්ව තමන්ට නිපදවිය හැකි භාණ්ඩ පමණක් විශාල ප්‍රමාණයක් නිපදවා අතිරික්තය අනෙකුත් පුද්ගලයන් සමඟ හුවමාරු කර ගනිමින් අවශ්‍ය අනෙකුත් භාණ්ඩ ලබා ගත් යුගය,

(1) ස්වයංපෝෂිත යුගය යි. (2) තාක්ෂණික යුගයයි.
(3) භාණ්ඩ හුවමාරු යුගය යි. (4) කාර්මික යුගය යි.

06. ගතිඳු පරිගණක අලුත්වැඩියා කිරීමේ පාඨමාලාවක් හදාරා ඇති අයෙකි. ඔහු නගර මධ්‍යයේ තම යහළුවෙකුගේ සහාය ද ඇතිව පරිගණක අලුත්වැඩියා කිරීමේ ආයතනයක් ඇරඹීය. ගතිඳුගේ ව්‍යාපාරයට අදාළ ශක්තියක් වනුයේ,

(1) ගතිඳුගේ ව්‍යාපාරය නගර මධ්‍යයේ පිහිටා තිබීමය.
(2) ගතිඳු පරිගණක පාඨමාලාවක් හදාරා තිබීමය.
(3) ගතිඳුගේ ව්‍යාපාරයට තරඟකරුවන්ගේ බලපෑමක් නොවීමය.
(4) පාරිභෝගිකයින් ව්‍යාපාරය කෙරෙහි දැඩි උනන්දුවක් දැක්වීමය.

07. ව්‍යාපාරයක අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාරය සතු සම්පත් මෙහෙයවීමට අවශ්‍ය තීරණ ගන්නා පුද්ගලයෝ

(1) අයිතිකරුවෝ ය. (2) සේවකයෝ ය.

(3) කළමනාකරුවෝ ය. (4) සැපයුම්කරුවෝ ය.

08. ව්‍යාපර සඳහා රජය විසින් පණවන අණ පනත් හා නීතිරීති අයත් පරිසරය වනුයේ,

(1) දේශපාලන පරිසරය (2) නෛතික පරිසරය

(3) ආර්ථික පරිසරය (4) ගෝලීය පරිසරය

09. දැව ආශ්‍රිත ගෘහභාණ්ඩ නිෂ්පාදන ආයතනයක නියුතු ඩිලීෂගේ ව්‍යාපාරයට අයත් ආර්ථික පරිසර සාධකයක් වනුයේ,

(1) අයවැය ප්‍රතිපත්ති (2) සාප්පු හා කාර්යාල සේවක පනත

(3) මධ්‍යම පරිසර අධිකාරිය (4) රැකියා නියුක්තිය

10. ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශව සහ ව්‍යාපාරය තුළ පවතින අනෙකුත් සාධක අයත් පරිසරය හඳුන්වනු ලබන්නේ,

(1) අභ්‍යන්තර පරිසරය ලෙස ය. (2) බාහිර පරිසරය ලෙස ය.

(3) තාක්ෂණික පරිසරය ලෙස ය. (4) නෛතික පරිසරය ලෙස ය.

11. ඩොලරය මුදල් ඒකකයක් ලෙස භාවිතා කරන රටවල් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදය, කැනඩාව

(2) එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ප්‍රංශය

(3) එක්සත් ජනපදය, සිංගප්පූරුව, කැනඩාව, ඕස්ට්‍රේලියාව

(4) එක්සත් ජනපදය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය, කැනඩාව

12. අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන රජයේ ඍජු පාලනයට යටත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) රාජ්‍ය දෙපාර්තමේන්තු (2) රාජ්‍ය සංස්ථා

(3) ව්‍යවස්ථාපිත සමාගම් (4) රාජ්‍ය සමාගම්

13. ලාභ අරමුණු කරගත් පොදු අංශයේ ව්‍යාපාර සංවිධාන විශේෂයකි.

(1) සමූපකාර සමිති (2) දෙපාර්තමේන්තු (3) රාජ්‍ය සංස්ථා (4) රාජ්‍ය සමාගම්

- **පහත තොරතුරු ඇසුරින් 14 - 15 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"අමායා නවරත්න" විසින් "අමායා ස්ටෝර්ස්'' නමින් වන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

14. "අමායා ස්ටෝර්ස්" සම්බන්ධව සත්‍ය ප්‍රකාශනය තෝරන්න.

(1) අඛණ්ඩ පැවැත්මක් ඇත. (2) ලියාපදිංචිය අනිවාර්ය නැත.

(3) නීතිමය පුද්ගලභාවයක් නොමැත. (4) වගකීම සීමිත වේ.

15. "අමායා ස්ටෝර්ස්" නාමය ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ,

(1) අදාළ පළාත් සභාවේ ව්‍යාපාර කටයුතු භාර ලේකම්වරයා ය.

(2) අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ටාර්වරයා ය.

(3) අදාළ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ටාර්වරයා ය.

(4) අදාළ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපාර කටයුතු භාර ලේකම්වරයා ය.

16. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය පිළිබඳව අසත්‍ය ප්‍රකාශනය තෝරන්න.

(1) ගනුදෙනු රාශියක් එකවර කිරීමට හැකියාව ලැබීම.

(2) ගනුදෙනුව සිදුවීමත් සමග සියලු පාර්ශව එක්ව දැනුවත් වීම හා ප්‍රතිචාර දැක්වීම.

(3) ගනුදෙනුව සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම.

(4) තාක්ෂණික දෝෂ නිසා දත්ත නැතිවීමේ අවදානම.

17. වත්කමක ලක්ෂණයක් නොවන්නේ,

(1) වර්තමාන බැඳීමක් තිබීම. (2) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම.

(3) ව්‍යාපාරයේ පාලනයට යටත් වීම. (4) අනාගතයේ ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

18. ව්‍යාපාරයක සිදුවන පහත ගනුදෙනු ඇසුරින් වියදමක් යන්නට නොගැනෙන්නේ කුමක්ද?

(1) වැටුප් හා වේතන ගෙවීම. (2) විකුණූ භාණ්ඩ සඳහා දරා ඇති පිරිවැය

(3) ණයපොළී (4) ගැනිලි සිදු කිරීම.

19. යම් දිනයකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| 350 000 | = | 275 000 | + | 75 000 |

මෙම ව්‍යාපාරයේ අයිතිකරු තම පෞද්ගලික මුදලින් රු. 25 000/- ක ණය හිමියන් පියවූ පසු ගිණුම්කරණ සමීකරණය කෙසේ වේද?

(1) 325 000 = 275 000 + 50 000 (2) 350 000 = 300 000 + 50 000

(3) 350 000 = 275 000 + 75 000 (4) 300 000 = 250 000 + 50 000

20. පහත එක් එක් ගිණුම්වල ද්විත්ව සටහන් මූලධර්මය අනුව සටහන් කරන ආකාරය දක්වා ඇත. වැරදි පිළිතුර තෝරන්න.

(1) විදුලි ගාස්තු ගිණුම වැඩිවීම හර, අඩුවීම බැර (2) ණය හිමියේ වැඩිවීම බැර, අඩුවීම හර

(3) බැංකු ණය ගිණුම වැඩිවීම හර, අඩුවීම බැර (4) විකුණුම් ගිණුම වැඩිවීම බැර, අඩුවීම හර

21. පහත සඳහන් ගිණුම් අතුරින් වත්කම් ගිණුමක් නොවන්නේ,

(1) ලී බඩු ගිණුම (2) ණය හිමි ගිණුම (3) ණයගැති ගිණුම (4) ස්ථාවර තුන්පතු ගිණුම

22. රු. 2 000 ක ලද පොලී සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ණය පොලී ගිණුම හර රු. 2 000
මුදල් ගිණුම බැර රු. 2 000

(2) ලද පොලී ගිණුම හර රු. 2 000
මුදල් ගිණුම බැර රු. 2 000

(3) මුදල් ගිණුම හර රු. 2 000
ලද පොලී ගිණුම බැර රු. 2 000

(4) මුදල් ගිණුම හර රු. 2 000
ණය පොලී ගිණුම බැර රු. 2 000

23. පහත සඳහන් ප්‍රකාශ අතුරින් ලෙජරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් සහ වියදම් ගිණුම් සියල්ල පවත්වාගෙන යන ස්ථානය ලෙජරය ලෙස හඳුන්වයි.

(2) ව්‍යාපාරයක පවතින මූලික සටහන් පොත් සියල්ල පවත්වාගෙන යන ස්ථානය ලෙජරය ලෙස හඳුන්වයි.

(3) ද්විත්ව සටහනෙන් එක සටහක් පමණක් ලෙජරයෙහි සටහන් කරනු ලබයි.

(4) මූලාශ්‍ර ලේඛන වලින් හඳුනාගත් ගනුදෙනු හා සිද්ධීන් ඉන් පසු ලෙජරයෙහි පිටපත් කරනු ලබයි.

24. ගැනිලි ගිණුම අයත් වන්නේ පහත සඳහන් ගිණුම් අතුරින් කුමකට ද?

(1) වත්කම් ගිණුම් (2) වගකීම් ගිණුම් (3) හිමිකම් ගිණුම් (4) ආදායම් ගිණුම්

25. "වෙළඳ භාණ්ඩ ණයට ගැනීම" සටහන් කරන මූලික සටහන් පොත වන්නේ,

(1) මුදල් පොත (2) විකුණුම් ජ'නලය (3) ගැනුම් ජ'නලය (4) පොදු ජ'නලය

26. මූලික සටහන් පොත්වල අවශ්‍යතාවයක් නොවන්නේ,

(1) ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය වීම.

(2) මූලික සටහන් පොත්වල ගනුදෙනු සටහන් කළ පසු ඒවා ලෙජර් ගිණුම් වලට පිටපත් කිරීම විධිමත් වීම සහ පහසු වීම.

(3) ගිණුම්කරණ දෝෂ අඩුවීම සහ සිදුවන දෝෂ හඳුනාගැනීම පහසු වීම.

(4) කාලච්ඡේදයකට අයත් එකම ස්වරූපයේ ගනුදෙනු වර්ග කර සටහන් කිරීමට අවශ්‍ය වීම.

27. ලී බඩු වෙළඳ සැලක ලී බඩු බෙදාහැරීම සඳහා මෝටර් රථයක් ණයට මිලදී ගැනීම සටහන් කරන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

(1) විකුණුම් ඉන්වොයිසිය (2) ගැනුම් ඉන්වොයිසිය

(3) ජ'නල් වවුචරය (4) ගෙවීම් වවුචරය

28. බැංකු ජංගම ගිණුමෙන් මුදල් නැවත ලබා ගන්නා විට භාවිත කරන නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් ගිණුම හර
බැංකු ගිණුම බැර

(2) බැංකු ගිණුම හර
මුදල් ගිණුම බැර

(3) මුදල් ගිණුම හර
බැංකු ණය ගිණුම බැර

(4) බැංකු ණය ගිණුම හර
මුදල් ගිණුම බැර

29. ව්‍යාපාරයක ජනවාරි මාසයට අදාළ සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය රු. 21 500 කි. ජනවාරි මාසයට අදාළ බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු. 18 200 කි. මෙම වෙනසට පහත සඳහන් කුමන හේතුව බලපානු ලබයිද?

| | බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් | නිෂ්කාශනය නොවූ චෙක්පත් |
|---|---|---|
| (1) | රු. 7 800 | රු. 4 500 |
| (2) | රු. 10 800 | රු. 7 500 |
| (3) | රු. 9 300 | රු. 6 000 |
| (4) | රු. 7 500 | රු. 10 800 |

30. බැංකු ප්‍රකාශනයෙන් හඳුනාගත හැකි අයිතමයක් නොවනනේ,

(1) ඍජු ප්‍රේෂණ (2) නිෂ්කාශනය නොවූ චෙක්

(3) බැංකු ගාස්තු (4) ස්ථාවර නියෝග

31. ණයහිමි සඳුන්ට ගෙවිය යුතු රු. 30 000 ක ණය පියවීම සඳහා රු. 27 000 ක් ගෙවීමට අදාළ අසම්පූර්ණ ද්විත්ව සටන පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | 30 000 |
| ......①...... ගිණුම | බැර | ......②...... |
| මුදල් ගිණුම | බැර | ......③...... |

ඉහත ① , ② හා ③ ස්ථානවලට අදාළ නිවැරදි අයිතම පිළිවෙලින්,

(1) දුන් වට්ටම්, 3 000 , 27 000 (2) ලද වට්ටම්, 3 000 , 27 000

(3) ලද වට්ටම්, 3 000 , 30 000 (4) විකුණුම්, 3 000 , 27 000

- **ප්‍රශ්න අංක 31 හා 32 සඳහා පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගන්න.**
  නුවන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 10 000 කි.
  2019 අගෝස්තු 31 දිනට ප්‍රතිපූර්ණය කරන ලද අගය රු. 9 700 කි.

32. 2019 ආගෝස්තු මාසයට අදාළ සුළු වියදම් වනුයේ,

(1) රු. 9 700 (2) රු. 10 000 (3) රු. 9 300 (4) රු. 300

33. 2019 අගෝස්තු 31 දිනට සුළු මුදල් ශේෂය

(1) රු. 700 (2) රු. 9 700 (3) රු. 300 (4) රු. 9 300

34. ගැණුම් ජ'නලයේ එකතුව,

(1) ගැණුම් ගිණුමට බැර කළ යුතුය. (2) ණයහිමි ගිණුමට හර කළ යුතුය.

(3) ණයහිමි ගිණුමට බැර කළ යුතුය. (4) ගැණුම් ගිණුමට හර කළ යුතුය.

35. ගැණුම් ඉන්වොයිසියක කොන්දේසි - 10/60/ශුද්ධ 90 ලෙස සඳහන් කර ඇත.
මින් අදහස් වන්නේ,

(1) දින 90 ක් ඇතුළත ගෙවිය යුතුය. දින 60 කට පසු ගෙවන්නේ නම් 10% ක වට්ටමක් ගෙවිය යුතුය.

(2) දින 60 ක් ඇතුළත ගෙවිය යුතුය. දින 90 කට පෙර ගෙවන්නේ නම් 10% ක වට්ටමක් හිමි වේ.

(3) දින 60 ක් ඇතුළත ගෙවිය යුතු දින 90 කට පසු ගෙවන්නේ නම් 10% ක බද්දක් ගෙවිය යුතුය.

(4) දින 90 ක් ඇතුළත ගෙවිය යුතු දින 60 කට පෙර ගෙවන්නේ නම් 10% ක වට්ටමක් හිමි වේ.

36. සමීර ජංගම දුරකතන අලෙවිසැලක් පවත්වාගෙන යන අතර ඔහුගේ ව්‍යාපාරයේ ගැණුම් ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවකි.

(1) ජංගම දුරකතන 02 ක් අජිත් මොබයිල් ෂොප් වෙතින් ණයට ගැනීම.

(2) ජංගම දුරකතන 02 ක් අජිත් මොබයිල් ෂොප් වෙතින් මුදලට ගැනීම.

(3) පරිගණක යන්ත්‍රයක් ජගත් සමාගමෙන් ණයට ගැනීම.

(4) දුරකතන තැබීම සඳහා වානේ රාක්කයක් ජගත් සමාගමෙන් ණයට ගැනීම.

37. පොදු ජ'නලය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පොදු ජ'නලයට අදාළ මූලාශ්‍ර ලේඛනය ජ'නල් වවුචරය වේ.

(2) වැරදි නිවැරදි කිරීමේ සටහන් පොදු ජ'නලයේ සටහන් කරයි.

(3) නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට භාණ්ඩ ගැනීම පොදු ජ'නලයේ සටහන් කරයි.

(4) ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීම පොදු ජ'නලයේ සටහන් කරයි.

38. තරිඳුගේ ව්‍යාපාරයේ රු. 10 000 ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟ හැරී ඇත. මෙම වරද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන නම්,

(1) ගැනුම් ගිණුම හර රු. 10 000
ණයහිමි ගිණුම බැර රු. 10 000

(2) ණයහිමි ගිණුම හර රු. 10 000
ගැනුම් ගිණුම රු. 10 000

(3) ණයගැති ගිණුම හර රු. 10 000
ගැනුම් ගිණුම බැර රු. 10 000

(4) ගැනුම් ගිණුම හර රු. 10 000
ණයගැති ගිණුම බැර රු. 10 000

39. ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වැරද්දකි.

(1) රු. 15 000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් මඟ හැරීම.

(2) ණය හිමියෙකුගෙන් ලද රු. 1 300 ක වට්ටම මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ 3 100 ක් ලෙස සටහන් කිරීම.

(3) ගොඩනැගිලි කුලී ලෙස ගෙවූ රු. 15 000 ගොඩනැගිලි ගිණුමට හර කිරීම.

(4) රු. 1 500 ක දුරකථන බිලක් ගෙවීම මුදල් පොතේ නිවැරදිව සටහන් කර දුරකතන ගාස්තු ගිණුමට රු. 5 100 ලෙස සටහන් කිරීම.

40. ශේෂ පිරික්සුම හා සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ශේෂ පිරික්සුමට අදාළ මූලාශ්‍ර ලේඛනය ඉන්වොසියයි.

(2) ලෙජර ගිණුම තුලනය කර ලබා ගන්නා ශේෂ ඇසුරින් ශේෂ පරික්සුම සකසයි.

(3) හර හා බැර ශේෂ නිවැරදිව සටහන් කළේ නම් ශේෂ පිරික්සුම තුලනය වේ.

(4) ශේෂ පිරික්සුම තුලනය වූ පමණින් ගිණුම් තැබීම නිවැරදි බවට තහවුරු විය නොහැක.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

## 10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

වැදගත් :

- පළමු ප්‍රශ්ණයටත් I කොටසින් ප්‍රශ්න දෙකක්ද,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ගීතිකා නිසංසලී අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමෙන් පසු, තමා අධ්‍යාපනය ලැබූ පාසල අසල පිහිටි තම නැන්දනියට අයත් කඩ කාමරයක පාසල් ලිපි ද්‍රව්‍ය අලෙවිසැලක් වර්ෂ 2019 ජූලි මස 01 දින "ආකර්ෂා බුක්ෂොප්" නමින් ආරම්භ කළා ය. ඒ සඳහා තම පියා විසින් ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පත් කර තිබූ රුපියල් 100000 ක මුදල ද, එදිනම 12% ක වාර්ෂික ණය පොළියකට යටත්ව ලබා ගත් රු. 100000 ක බැංකු ණය මුදලද යොදවන ලදී.

2019 ජූලි 31 දිනෙන් අවසන් මාසය තුළ දී පහත ගනුදෙනු සිදුවිය.

| | | |
|---|---|---|
| 7/2 | රාක්ක හා කබඩ්වලට | රු. 30 000 |
| 7/2 | පොත්පත් හා ලිපිද්‍රව්‍ය ගැණුම් | රු. 50 000 |
| 7/2 | කාර්යාල උපකරණ සඳහා | රු. 10 000 |
| 7/2 | ඡායා පිටපත් යන්ත්‍රයට තීන්ත | රු. 15 000 |
| 7/10 | ඡායා පිටපත් කිරීමේ ආදායම | රු. 25 000 |
| 7/25 | පොත්පත් හා ලිපිද්‍රව්‍ය ගැණුම් | රු. 35 000 |
| 7/25 | ප්‍රවාහන ගාස්තු | රු. 5 000 |
| 7/30 | පොත්පත් හා ලිපිද්‍රව්‍ය විකුණුම් | රු. 30 000 |

තවද රු. 200 000 ක් වටිනා ඡායාපිටපත් යන්ත්‍රයක් මෙට්‍රොපොලිටන් ආයතනයෙන් ණයට ලබා ගන්නා ලදී. මෙම මාසයට අදාළ බැංකු ණය පොළිය ද තවම ගෙවා නොමැත.

(i) (අ) සිද්ධියට අනුව දැක්වෙන නිෂ්පාදිතය මගින් සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද? (ල.01)

(ආ) ඉහත සඳහන් ව්‍යාපාරය කුමන නිෂ්පාදන ව්‍යාපාරයක් ද? (ල.01)

(ii) මෙම ව්‍යාපාරයේ දක්නට ලැබන ශක්තියක් හා අවස්ථාවක් ලියන්න. (ල.02)

(iii) "ආකර්ෂා බුක්ෂොප්" ආයතනය ලියාපදිංචි කළ යුතුද? එසේ නම් ඊට හේතුව ලියන්න. (ල.02)

(iv) (අ) සිද්ධියේ දැක්වෙන ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේද? (ල.01)

(ආ) ඒ අනුව මෙම ව්‍යාපාරයේ වගකීම හා නීතිමය පුද්ගලභාවය පිළිබඳ කුමක් කිව හැකිද? (ල.01)

(v) "ආකර්ෂා බුක්ෂොප්" ව්‍යාපාරයේ 2019-07-01 දිනට ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වනන. (ල.02)

(vi) "ජායා පිටපත් යන්ත්‍රය" ණයට මිලදී ගැනීම සටහන් කරන මූලික සටහන් පොත හා මූලාශ්‍ර ලේඛනය ලියා දක්වන්න. (ල.02)

(vii) මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් දෙකක් ලියන්න. (ල.02)

(viii) (අ) "ආකර්ෂා බුක්ෂොප්" ව්‍යාපාරයේ මාසික බැංකු ණය පොළිය කොපමණද? (ල.01)

(ආ) බැංකු ණය ලබා ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල.01)

(ix) 2019-07-31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් පොත පිළියෙල කරන්න. (ල.02)

(x) මෙම ව්‍යාපාරයේ 2019-07-31 දිනට මුළු ආදායම කොපමණද? (ල.02)

# I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) නිෂ්පාදිතයේ ස්වභාවය අනුව ව්‍යාපාර වර්ගකරණ ආකාරය දක්වන්න. (ල.01)

(ආ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට අවශ්‍ය නිෂ්පාදන සාධක නම් කරන්න. (ල.01)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න. (ල.02)

(අ) සිල්ලර වෙළඳ ව්‍යාපාර, සේවා සැපයීමේ ව්‍යාපාරයකට නිදසුනකි.

(ආ) අවශ්‍යතා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකිය.

(ඉ) ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශව කොටස්කරුවන් වේ.

(ඊ) සෑම ව්‍යාපාරයක්ම කටයුතු කරනුයේ ලාභ ඉපයීමේ අපේක්ෂාවෙනි.

(iii) කසුන් එළවළු ගොවීන්ගෙන් එළවළු මිලදීගෙන සේවකයන් දෙදෙනෙකුගේ ද සහාය ඇතිව එළවළු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) කසුන් හැරුණු විට මෙම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව දෙකක් සිද්ධිය ඇසුරින් දක්වන්න. (ල.01)

(ආ) එම පාර්ශව ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතු එක බැගින් ලියන්න. (ල.01)

(iv) ලී බඩු නිෂ්පාදනය කරන ආයතනයක භාවිත කෙරෙන නිෂ්පාදන සම්පත් ලැයිස්තුවක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දැව | උපකරණ | අයිතිකරුවන්ගේ නිර්මාණශීලීත්වය |
| අත් උදව්කරු | මුදල් | ගොඩනැගිල්ල |

මෙම සම්පත් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක යටතේ වර්ග කර දක්වන්න. (ල.02)

03. (i) (අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් වන සාධක දෙකක් හා බාහිර පරිසරයට අයත් වන සාධක දෙකක් නම් කරන්න. (ල.01)

(ආ) පාරිභෝගිකයා මෙන්ම ව්‍යාපාරිකයා ද ආරක්ෂා කිරීමට විවිධ අණ පනත් පවතියි. එවැනි අණ පනත් හා නීතිරීති ක්‍රියාත්මක කිරීමට පවතින ආයතන දෙකක් ලියා දක්වන්න. (ල.01)

(ii) පහත ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න. (ල.02)

(අ) අයහපත් ආකල්ප සහිත සේවකයන් සිටීම ව්‍යාපාරයකට තර්ජනයකි.

(ආ) ව්‍යාපාර කටයුතු මෙන්ම පුද්ගල ජීවන රටාවද තාක්ෂණික පරිසර සාධක නිසා වෙනස්කම් වලට භාජනය වී ඇත.

(ඉ) අයවැය ප්‍රතිපත්තිය යනු ආර්ථික පරිසරයට අයත්වන සාධකයකි.

(ඊ) තම දක්ෂතාව හා හැකියාව ප්‍රයෝජනයට ගනිමින් පවරන ලද කාර්යය නිසි අයුරින් ඉටුකරන පුද්ගලයෝ, කළමනාකරුවෝ වෙති.

(iii) (අ) මහා නගර ව්‍යාපෘතිය යටතේ පසුගියදා හඳුන්වා දුන් කොළඹ මඟී ප්‍රවාහන බෝට්ටු සේවය කිනම් පාරිසරික තත්ත්වය යටතට ගැනේ ද? (ල.01)

(ආ) "උද්ධමනය"යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.01)

(iv) (අ) තාක්ෂණික වෙනස්වීම් නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම්වලට නිදසුන් දෙකක් දක්වන්න. (ල.01)

(ආ) ගෝලීය පරිසරය ව්‍යාපාර කෙරෙහි ඇතිකරන හිතකර බලපෑම හා අහිතකර බලපෑම් 02 බැගින් ලියන්න. (ල.01)

04. තුෂිත සහ නාමල් පිළිවෙලින් රු. 450 000 ක් සහ රු. 300 000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. ව්‍යාපාරය ලිඛිත ගිවිසුමක් පවත්වා නොගනියි.

(i) (අ) මෙම ව්‍යාපාරය ලිඛිත ගිවිසුමක් පවත්වා නොගැනීමෙන් බලපෑම් කරනු ලබන නීතිය කුමක්ද? (ල.01)

(ආ) හවුල් ගිවිසුමක් ලිඛිතව පවත්වාගෙන යනු ලබන්නේ නම් එය හඳුන්වන නම කුමක්ද? (ල.01)

(ii) පහත සඳහන් ප්‍රකාශ අසත්‍යයයි නම් "x" ලකුණද, සත්‍යයයි නම් "✓" ලකුණද යොදන්න. (ල.02)

(අ) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු සාමාජික සංඛ්‍යාව 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව තීරණය කරයි.

(ආ) හවුල් ව්‍යාපාර ලියාපදිංචි කළ හැකි බැවින් නෛතික පුද්ගලභාවයක් ලබා ගත හැකිය.

(ඉ) ඒක පුද්ගල ව්‍යාපාර අයිතිකරුගේ සම්පූර්ණ නමින් තොරවද පවත්වා ගත හැකිය.

(ඊ) සීමිත සාමගමකට අඛණ්ඩ පැවැත්මක් ඇත.

(iii) L. A. සුමනසිරි විසින් 'සිරිසර විලාසිතා' නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

(අ) "සිරසර විලාසිතා" ව්‍යාපරය ලියාපදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ඉල්ලුම් පත්‍ර දෙක ලියා දක්වන්න. (ල.01)

(ආ) එම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි වාසි 02 ක් සඳහන් කරන්න. (ල.01)

(iv) (අ) ජංගම දුරකථන බැංකුකරණයේ වාසි 02 ක් දක්වන්න. (ල.01)

(ආ) වර්තමානයේ දී භාවිත කරන පරිගණක මෘදුකාංග 02 ක් සඳහන් කරන්න. (ල.01)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) ව්‍යාපාරයක ජනවාරි මාසය තුල සිදු වූ ගනුදෙනු හා සිද්ධීන් වලින් ගිණුම්කරණ සමීකරණයට වූ බලපෑම පහත පරිදි දක්වා ඇත.

| | වත්කම් | | | | = | හිමිකම් | + වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | මෝටර් රථ + | තොගය + | ණයගැති + | මුදල් | = | ප්‍රාග්ධනය + | ණය හිමි |
| (i) 01/05 | - | +80 000 | - | - | = | - | + 80 000 |
| (ii) 01/09 | +200 000 | - | - | -200 000 | = | - | - |
| (iii) 01/13 | - | -50 000 | +80 000 | - | = | +30 000 | - |
| (iv) 01/18 | - | - | - | -40 000 | = | - | -40 000 |

මෙම ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ලියා දක්වන්න. (ල.04)

(ii) පහත සඳහන් ව්‍යාපාරයේ අයිතම වත්කම්, වගකීම්, හිමිකම්, වියදම් යන ශීර්ෂ යටතේ වර්ග කරන්න.

| | |
|---|---|
| ලී බඩු උපකරණ | ණය ගැතියෝ |
| ගැනිලි | ණය හිමියෝ |
| රක්ෂණය | සේවක වැටුප් |
| බැංකු ණය | ප්‍රාග්ධනය |

(ල.02)

(iii) ජීවන්තගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2018/01/01 ප්‍රාග්ධනය | 525 000 | අමතර ප්‍රාග්ධනය | 120 000 |
| වර්ෂයේ ආදායම | 212 500 | ගැනිලි | 35 000 |
| වර්ෂයේ වියදම | 147 500 | | |

2018/12/31 දිනට ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න. (ල.02)

(iv) රංග ගේ ව්‍යාපාරයේ මාර්තු මාසයට අදාළ පහත ගනුදෙනු ගිණුම්ගත කර දක්වන්න.

(අ) 03/08 රු. 20 000 ක් ගැනිලි සිදු කිරීම.

(ආ) 03/08 රු. 45 000 ක බැංකු ණය ගෙවීම

(ඉ) 03/08 රු. 25 000 ක වැටුප් ගෙවීම.

(ඊ) 03/08 රු. 2 000 ක විදුලි බිල ගෙවීම. (ල.04)

06. (i) (අ) මූලාශ්‍ර ලේඛනයක් යනු කුමක්ද? (ල.01)

(ආ) බැංකු ගිණුම හා සම්බන්ධ මූලාශ්‍ර ලේඛන 02 ක් ලියන්න. (ල.01)

(ii) පහත දැක්වෙන්නේ රවීෂගේ ව්‍යාපාරයේ බැංකු ගනුදෙනු

2019/7/04 රු. 44 000 තැන්පත් කර බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීම.

2019/7/10 ණයගැතියෙකුගෙන් අංක 255 දරණ රු. 18 000 චෙක්පත ලැබුනා.

2019/7/16 ණයගැතියෙකුගෙන් ලැබී තිබුන අංක 255 දරණ චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම.

2019/7/20 චෙක්පත් අංක 601 යටතේ ණයහිමියන්ට රු. 20 200 ගෙවීම අඩුකළ වට්ටම රු. 800

2019/7/26 ණයැතියන්ගෙන් අංක 432 දරණ රු. 11 400 චෙක්පත ලැබුණි. ලබාදුන් වට්ටම රු. 600 කි. මෙම චෙක්පත එම අවස්ථාවේදීම බැංකුවේ තැන්පත් කරන ලදී.

අවශ්‍ය වන්නේ රවීෂගේ ව්‍යාපාරයේ 2019/7/31 බැංකු ගිණුම සකසා තුලනය කරන්න. (ල.04)

(iii) (අ) වෙළඳ වට්ටම් යනු මොනවාද? (ල.01)

(ආ) මුදල් පොතේ බැර පැත්තේ වට්ටම් තීරුවට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ල.01)

(iv) දනිඳුගේ ව්‍යාපාරයේ 2019 මැයි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 5/1 | ල.අ. 002 | සුළු මුදල් භාරකරුට ප්‍රධාන මුදල් භාරකරුගෙන් රු. 3000 ක් ලැබීම. |
| 5/2 | ව.අ. 101 | ලිපිද්‍රව්‍ය රු. 300 ක ගැනීම. |
| 5/5 | ව.අ. 102 | සංග්‍රහ වියදම රු. 450 කි. |
| 5/10 | ව.අ. 103 | තැපැල් ගාස්තු රු. 150 |
| 5/15 | ව.අ. 104 | සංග්‍රහ වියදම් රු. 350 |
| 5/22 | ව.අ. 105 | ණයහිමියෙකු වූ පෙරේරා ගෙවිය යුතු රු. 500 ක් ගෙවීම. |
| 5/28 | ව.අ. 106 | මුද්දර ගාස්තු රු. 125 කි. |

අවශ්‍ය වන්නේ,

සුළු මුදල් පොත පිළියෙල කර 2019.06.01 දිනට අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. (ල.04)

07. (i) (අ) බැංකු ප්‍රකාශයක් යනු කුමක්ද? (ල.01)

(ආ) බැංකු ප්‍රකාශනයක ඇතුලත් වන අයිතම 02 ක් ලියන්න. (ල.01)

(ii) පහත දැක්වෙන්නේ 2019 අගෝස්තු මාසය සඳහා ව්‍යාපාරයක් පිළියෙල කළ බැංකු ගිණුම හා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයයි.

බැංකු ගිණුම

| දිනය | ල.අ. | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | ච.අ. | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8/1 | | ශේෂය | | 23 700 | 8/10 | | ණයහිමි 375190 | | 2 500 |
| 8/9 | | චෙක් තැන්පත් (119790) | | 5 000 | 8/11 | | ප්‍රවාහනවි. 375191 | | 3 500 |
| 8/20 | | චෙක් තැන්පත් (213871) | | 7 000 | 8/23 | | ගැණුම් 375192 | | 20 000 |
| | | | | | 8/31 | | ශේෂය ප/ගෙ | | 9 700 |
| | | | | 35 700 | | | | | 35 700 |
| 9/1 | | ශේෂය ඉ/ගෙ | | 9 700 | | | | | |

2019.08 වන මාසය සඳහා බැංකු ප්‍රකාශනය

| | | | | |
|---|---|---|---|---|
| 8/1 | ශේෂය | - | - | 23 700 |
| 8/10 | චෙ.අ. 375190 | 2 500 | - | 21 200 |
| 8/11 | චෙක් තැන්පත් 119790 | - | 5 000 | 26 200 |
| 8/11 | චෙ.අ. 375191 | 3 500 | - | 22 700 |
| 8/24 | ඍජු ප්‍රේෂණ | - | 9 000 | 31 700 |
| 8/29 | ස්ථාවර නියෝග කඩ කුලී | 7 000 | - | 24 700 |

අවශ්‍ය වන්නේ,

(අ) 2019.08.30 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම. (ල.03)

(ආ) 2019.08.30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය (ල.03)

(iii) යසිතගේ ව්‍යාපාරයේ පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව බැර තීරුවට වඩා රු. 2 300 කින් අඩු වූ අතර ඒ සඳහා පහත ගිණුම්කරණ වැරදි බලපා ඇත.

(i) රු. 2300 ක රක්ෂණ ගාස්තු ගෙවීම පිළිබඳ මුදල් පොතේ හැර වෙනත් සටහනක් තබා නැත.

(ii) රු. 5000 ක ගොඩනැගිලි අළුත් වැඩියා වියදම් ගොඩනැගිලි ගිණුමට හර කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් (ල.02)

(ආ) අවිනිශ්චිත ගිණුම. (ල.02)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(1) | 3 -(1) | 4 -(4) | 5 -(3) | 6 -(2) | 7 -(3) | 8 -(2) | 9 -(4) | 10 -(1) |
| 11-(3) | 12 -(1) | 13 -(4) | 14 -(3) | 15 -(2) | 16 -(3) | 17 -(1) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21-(2) | 22 -(3) | 23 -(1) | 24 -(3) | 25 -(3) | 26 -(1) | 27 -(3) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(4) | 35 -(4) | 36 -(1) | 37 -(3) | 38 -(1) | 39 -(4) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

01. (i) (අ) අධ්‍යාපනය (ල.01)

(ආ) සේවා නිෂ්පාදන ව්‍යාපාරයක් (ල.01)

(ii) ශක්තිය - පියා සතු ගොඩනැගිල්ල - පියා විසින් ඉතිරි කර තිබූ මුදල

අවස්ථාව - පාසලක් අසල පිහිටා තිබීම. (ල.02)

(iii) ලියාපදිංචි කළ යුතුය. එයට හේතුව අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නාමයකින් ව්‍යාපාරය පවත්වාගෙන යන බැවිනි. (ල.02)

(iv) (අ) පෞද්ගලික අංශයේ / ලාභ අරමුණු කර ගත් / ඒක පුද්ගල ව්‍යාපාරයකි. (ල.01)

(ආ) වගකීම අසීමිත වේ. / නීතිමය පුද්ගලභාවයක් නොමැත. (ල.01)

(v)

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| මුදල් | 100 000 | = | 100 000 | + | බැ. ණය 100 000 |
| මුදල් | 100 000 | = | | + | |
| | 200 000 | = | 100 000 | + | 100 000 |

(ල.02)

(vi) පොදු ජ'නලය - ජ'නල් වවුචරය. (ල.02)

(vii) රාක්ක හා කබඩ්වලට රු. 30 000

කාර්යාල උපකරණ රු. 10 000

ඡායා පිටපත් යන්ත්‍රය රු. 200 000 (ල.02)

(viii) (අ) $100\,0\not{0}\not{0} \times \frac{12}{1\not{0}\not{0}} \times \frac{1}{12}$ = රු. 1000.00 (ල.01)

(ආ) මුදල් ගිණුම් හර 100 000

බැංකු ණය ගිණුම 100 000 (ල.01)

(ix) 2019.07.31 දිනෙන් අවසන් මාසයට අදාළ මුදල් පොත

| දිනය | ලදුපත් අංකය | විස්තරය | මුදල් | දිනය | ගෙවීම් වවුචරය | විස්තරය | මුදල් |
|---|---|---|---|---|---|---|---|
| 2019 | | | | | | | |
| 7/1 | | ප්‍රාග්ධන ගිණුම | 100 000 | 7/2 | | රාක්ක හා කබඩ්වලට | 30 000 |
| 7/1 | | බැංකු ණය | 100 000 | 7/2 | | පොත්පත් හා ලිපිද්‍රව්‍යය | 50 000 |
| 7/10 | | ඡායාපිටපත් ආදායම | 25 000 | 7/2 | | කාර්යාල උපකණ | 10 000 |
| 7/30 | | පොත්පත් අලෙවිය | 30 000 | 7/2 | | ඡායා පිටපත් යන්ත්‍රයට තීන්ත | 15 000 |
| | | | | 7/25 | | පොත් හා ලිපි ද්‍රව්‍යය | 35 000 |
| | | | | 7/25 | | ප්‍රවාහන ගාස්තු | 5 000 |
| | | | | 7/31 | | ප/ගෙ/ශේෂය | 110 000 |
| | | | 255 000 | | | | 255 000 |
| 8/1 | | ශේෂය ඉ/ගෙ | 110 000 | | | | (ල.02) |

| | | | |
|---|---|---|---|
| (x) | ඡායා පිටපත් කිරීමේ ආදායම | රු. 25 000 | |
| | පොත්පත් හා ලිපිද්‍රව්‍ය අලෙවියෙන් | රු. 35 000 | |
| | මුළු ආදායම | රු. 55 000 | (ල.02) |

## I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02.

(i) (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර සේවා සැපයීමේ ව්‍යාපාර (ල.01)

(ආ) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය (ල.01)

(ii) (අ) සත්‍යය (ආ) අසත්‍යය

(ඉ) අසත්‍යය (ඊ) අසත්‍යය (ල.02)

(iii) (අ) එළවළු ගොවීන් (සැපයුම්කරුවන්) සේවකයන් (ල.01)

(ආ) සැපයුම්කරුවන් :- නිසි පරිදි මුදල් ලබා ගැනීමට / අඛණ්ඩව ඇණවුම් ලබාගැනීමට

සේවකයින් :- සාධාරණ වැටුප් ලබා ගැනීමට. / රැකියා සුරක්ෂිත බව. (ල.01)

(iv) භූමිය - දැව ශ්‍රමය - අත් උදව්කරු

ප්‍රාග්ධනය - උපකරණ, මුදල්, ගොඩනැගිල්ල ව්‍යවසාය - අයිතිකරුගේ නිර්මාණශීලීත්වය (ල.02)

03. (i) (අ) <u>අභ්‍යන්තර පරිසරය</u>

අයිතිකරුවෝ, සේවකයෝ, කළමනාකරුවෝ.

<u>බාහිර පරිසරය</u>

සැපයුම්කරුවෝ, තරඟකරුවෝ, පාරිභෝගිකයෝ.

තාක්ෂණික පරිසරය

ආර්ථික පරිසරය

දේශපාලන පරිසරය

නෛතික පරිසරය

ගෝලීය පරිසරය (ල.01)

(ආ) පාරිභෝගි කටයුතු පිළිබඳ අධිකාරිය

කම්කරු විනිශ්චය සභා

මධ්‍යම පරිසර අධිකාරිය (ල.01)

(ii) (අ) අසත්‍යය (ආ) සත්‍යය

(ඉ) අසත්‍යය (ඊ) අසත්‍යය (ල.02)

(iii) (අ) දේශපාලන පරිසරය (ල.01)

(ආ) භාණ්ඩ හා සේවා අලෙවියේදී තීරණයවන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම. (ල.01)

(iv) (අ)
- අත් යන්ත්‍ර යොදා කළ රෙදි පිළි නිෂ්පාදනය නවීන යන්ත්‍ර යොදා සිදු කිරීම.
- සාමාන්‍ය තැපැල වෙනුවට E-mail, දුරකථන ආදිය භාවිතය
- පොත් වල තැබූ ගිණුම් සටහන් Quick book වැනි ගිණුම්කරණ මෘදුකාංග භාවිතයෙන් සිදු කිරීම.

(නිවැරදි පිළිතුරකට ලකුණු 01) (ල.01)

(ආ) හිතකර :-
- ගුණාත්මක භාණ්ඩ පැමිණීම නිසා වෙළඳපළ කටයුතු පුළුල් වීම.
- නවීන තාක්ෂණය ලබා ගත හැකි වීම.
- නවෝත්පාදන බිහි වීම.
- ගුණාත්මක අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.
- විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.

අහිතකර :-
- දැඩි තරඟකාරීත්වයට මුහුණ දීමට සිදුවීම.

- දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම.
- දේශීය ළදරු කර්මාන්තවල පැවැත්මට බාධාවක් වීම.
- දේශීය සංස්කෘතියට බලපෑම් සිදුවීම (ල.01)

04. (i) (අ) වංචා වැළැක්වීමේ ආඥා පනත (ල.01)

(ආ) හවුල් ඔප්පුව (ල.01)

(ii) (අ) ✓ (ආ) X

(ඉ) ✓ (ඊ) ✓ නිවැරදි පිළිතුරකට ලකුණු ½ බැගින් (ල.02)

(iii) (අ) 1. ඒක පුද්ගල ව්‍යාපාරනාමය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

2. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යවන ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම. (ල.01)

(ආ) 1. අනන්‍යතාවයක් ලැබීම.

2. ව්‍යාපාරයේ නාමයේ අයිතිය තහවුරු කිරීම.

3. රජයෙන් ලබා දෙන දිරිගැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම.

4. ණය ලබා ගැනීමේදී පහසු වීම. (ල.01)

(iv) (අ) ඕනෑම නිවැරදි පිළිතුරු 01 කට ලකුණු ½ බැගින් ලකුණු 01 යි.

උදා:- ගනුදෙනු කිරීම පහසුවීම. කාලය, ශ්‍රමය ඉතිරි කර ගත හැකි වීම. (ල.01)

(ආ) ඕනෑම නිවැරදි පිළිතුරු 01 කට ලකුණු ½ බැගින් ලකුණු 01 කි.

Acc pac MYO B

Quick book Sage (ල.01)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (i) 01/05 රු. 80 000/- ක තොගයක් ණයට මිලදී ගැනීම.

(ii) 01/09 රු. 200 000/- වටිනා මෝටර් රථයක් අත්පිට මිලට ගැනීම.

(iii) 01/13 රු. 50 000/- තොගයක් රුත 80 000/- ණයට විකිණීම

(iv) 01/18 රු. 40 000/- ණය හිමියන්ට ගෙවීම.

(ii)

| වත්කම් | වියදම් | වගකීම් | හිමිකම් | |
|---|---|---|---|---|
| ලීබඩු උපකරණ | සේවක වැටුප් | ණය හිමියෝ | ප්‍රාග්ධනය | |
| ණයගැතියෝ | රක්ෂණය | බැංකු ණය | ගැනිලි | (ල. ½ x 8 = 02) |

(iii)

| | | | |
|---|---|---|---|
| ණය හිමියෝ | 50 000 | | |
| බැංකු ණය | 2000 000 | (250 000) | (ල.01) |
| ප්‍රාග්ධනය | | 410 000 | |

(ii)

| | | | | |
|---|---|---|---|---|
| | 2018/01/01 ප්‍රාග්ධනය | 525 000 | | |
| (+) | වර්ෂයේ ආදායම | 212 500 | ලකුණු ½ | |
| | | 737 500 | | |
| (-) | වර්ෂයේ වියදම | (147 500) | ලකුණු ½ | |
| | | 590 000 | | |
| (+) | අමතර ප්‍රාග්ධනය | 120 000 | ලකුණු ½ | |
| | | 710 000 | | |
| (-) | ගැනිලි | (35 000) | ලකුණු ½ | (ල.02) |
| | 2018/12/31 හිමිකම් | 675 000 | | |

(iii)

මුදල් ගිණුම

| දිනය | ලදුපත් අංකය | විස්තරය | මුදල් | දිනය | ගෙවීම් වවුචරය | විස්තරය | මුදල් |
|---|---|---|---|---|---|---|---|
| | | | | 3/08 | | ගැනිලි ගිණුම | 20 000 |
| | | | | 3/12 | | බැංකුණය ගිණුම | 45 000 |
| | | | ල. ½ බැගින් ල. 2 | 3/18 | | වැටුප් ගිණුම | 25 000 |
| | | | | 3/27 | | විදුලිය ගිණුම | 2 000 |

**ගැනිලි ගිණුම**

| | |
|---|---|
| 03/08 මුදල් 20 000 | (1/2) |

**බැංකු ණය ගිණුම**

| | |
|---|---|
| 03/12 මුදල් 45 000 (1/2) | |

**වැටුප් ගිණුම**

| | |
|---|---|
| 03/18 මුදල් 25 000 | (1/2) |

**විදුලි ගිණුම**

| | |
|---|---|
| 03/27 මුදල් 2 000 (1/2) | |

(ල.04)

06. (i) (අ) ගනුදෙනුවක් සිදු වූ අවස්ථාවේදී ම එහි සියලු විස්තර ඇතුළත් කරන ලියවිල්ල මූලාශ්‍ර ලේඛනය නම් වේ. (ල.01)

(ආ) පිළිපත, බැංකු ප්‍රකාශය, ගෙවීම් වවුචර, තැන්පත් කිරීමේ කුවිතාන්සි, අගරු චෙක්පත් දැනුම් දීමේ නිවේදනය (ල.01)

(ii)

රවිශ්ගේ ව්‍යාපාරය
2019/07/31 දිනට බැංකු ගිණුම

(ල.½)

| දිනය | විස්තරය | ස පි | වට්ටම් | වටිනාකම | දිනය | විස්තරය | ස පි | වට්ටම් | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 7/1 | මුදල් | | (ල.½) | 44 000 | 7/20 | ණය හිමි (601) | | 800 | 20 200 (ල.½) |
| 7/16 | මුදල් (255) | | (ල.½) | 18 000 | (ල.½) | | | | |
| 7/26 | ණයගැති (432) | | 600 | 11 400 | 7/31 | ශේෂය ප/ගෙ | | | 52 200 |
| | | (ල.½) | 600 | 73 400 | | | (ල.½) | 800 | 73 400 |
| 8/1 | ශේෂය ඉ/ගෙ | | | 35 200 | (ල.½) | | | | |

(iii) අ) භාණ්ඩයක ලකුණු කළ මිලෙන් කරනු ලබන අඩු කිරීම වෙළඳ වට්ටම වේ. (ල.01)

(ආ) ණයහිමි ගිණුම හර

ලද වට්ටම් ගිණුම බැර (ල.01)

(iii) අ) භාණ්ඩයක ලකුණු කළ මිලෙන් කරනු ලබන අඩු කිරීම වෙළඳ වට්ටම වේ. (ල.01)

(ආ) ණයහිමි ගිණුම හර

ලද වට්ටම් ගිණුම බැර (ල.01)

(iv)

සුළු මුදල් පොත

| ලැබීම | ස.පි. | දිනය | විස්තරය | ව.අ. | ගෙවීම් | විශ්ලේෂණය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ලිපි ද්‍රව්‍ය | සංග්‍රහ | තැපැල් | ලෙජර් ගිණුම | (ල.½) |
| 3000 | | 5/1 | මුදල් පොත | | | | | | | |
| | | 5/2 | ලිපිද්‍රව්‍ය | 101 | 300 | 300 | - | - | - | |
| | | 5/5 | සංග්‍රහ වියදම් | 102 | 450 | - | 450 | - | - | |
| | | 5/10 | තැපැල් ගාස්තු | 103 | 150 | - | - | 150 | - | |
| | | 5/15 | සංග්‍රහ වියදම් | 104 | 350 | - | 350 | - | - | |
| | | 5/22 | පෙරේරා | 105 | 500 | - | - | - | 500 | (ල.½) |
| | | 5/28 | මුද්දර | 106 | 125 | - | - | 125 | - | |
| | | | | | 1875 | 300 | 800 | 275 | 500 | |
| | | | ශේෂය ප/ගෙ | | 1125 | ලෙ.පි. | ලෙ.පි. | ලෙ.පි. | | |
| 3000 | | | | | 3000 | (ල.½) | (ල.½) | (ල.½) | | |
| 1125 | | | ඉ/ගෙ ශේෂය (ල.½) | | | | | | | |
| 2375 | | | මුදල් පොත (ල.½) | | | | | | | |

07. (i) (අ) බැංකු ජංගම ගිණුම් හිමියෙකුට වාණිජ බැංකුව විසින් සාමාන්‍යයෙන් මාසයකට වරක් එවනු ලබන වාරතාව බැංකු ප්‍රකාශය නම් වේ. (ල.01)

(ආ) චෙක් තැන්පත්, චෙක් නිකුත් කිරීම්, මුදල් තැන්පත්, බැංකු ගාස්තු, ඍජු ප්‍රේෂණ.... ආදී කරුණු 02 ක් (ල.01)

(ii)

සංශෝධිත බැංකු ගිණුම

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9/1 | ශේෂය | 9 700 | | ස්ථාවර නියෝග | 7000 | (1) |
| | ඍජු ප්‍රේෂණ (1) | 9 000 | 9/30 | ප/ගෙ/ශේ. | 11 700 | (1) |
| | | 18 700 | | | 18 700 | |
| 10/1 | ශේ/ඉ/ගෙ | 11 700 | | | | |

(ල.03)

2019 සැප්තැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| 10/1 සංශෝධිත බැංකු ශේෂය | | 11 700 | |
| <u>එකතු කළා :-</u> | | | |
| බැංකුවට ඉදිරිපත් නොකළ චෙක් | 20 000 | 20 000 | (ල.01) |
| | | 31 700 | |
| <u>අඩු කළා :-</u> | | | |
| නිශ්කාශනය නොවූ චෙක් (213871) | 7 000 | (7 000) | (ල.01) |
| 2019/09/30 දිනට බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය (ල.01) | | 24 700 | |

(ල.03)

(iii)

පොදු ජ'නලය

| | | | |
|---|---|---|---|
| රක්ෂණ ගාස්තු ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(රක්ෂණ ගාස්තු ගෙවීම රක්ෂණ ගාස්තු ගිණුමට හර නොවීම් වරද නිවැරදි කිරීම.) | 2 300 | 2 300 | (ල.01) |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් හර<br>ගොඩනැගිලි ගිණුම<br>(ගොඩනැගිලි කුලී ගෙවීම ගොඩනැගිලි ගිණුමේ සටහන් කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම.) | 5 000 | 5 000 | (ල.01) |

(ල.02)

අවිනිශ්චිත ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| ශේෂ පිරික්සුමේ වෙනස (ල.01) | 2 300 | රක්ෂණ ගාස්තු | 2 300 | (ල.01) |
| | 2 300 | | 2 300 | |

(ල.02)